# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1444/20 – 2006 මැයි 11 වැනි බ්‍රහස්පතින්දා – 2006.05.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාත් සභාව

ඌව පළාත් සභාවේ 2003 අංක 03 දරන ඌව පළාත් සභාවේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් 2003 දෙසැම්බර් මස 18 වන දින සම්මත කරන ලදුව 2003 දෙසැම්බර් 18 වන දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,<br>
සභා ලේකම්,<br>
ඌව පළාත් සභාව.

2006 මැයි 03 වන දින,<br>
බදුල්ලේ රජ වීදියේ පිහිටි,<br>
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

ඌව පළාත් සභාවේ "ආණ්ඩුකාරවර අරමුදල" පිළිබඳ ප්‍රඥප්තිය

ඌව පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම, අධ්‍යාපන හෝ දැනුම වර්ධනය කිරීම, ආගම නංවාලීම, ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම, ඌව පළාත වෙනුවෙන් විශිෂ්ඨ සේවාවක් කළ තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සහ පළාතේ ජනතාවගේ යහපත හා අභිවෘද්ධිය සලස්වාලන වෙනත් කාර්යයන් සඳහා "ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.*

කෙටිනාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2003, 03 දරන "ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලැබේ. එයට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාදුන් දින සිට බලපවත් වන්නේ ය.

අණ්ඩුකාර අරමුදලක් පිහිටුවීම

2. (1) මෙහි මින්මතු " අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන "ඌව පළාතේ ආණ්ඩුකාරවර අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියෙන් අරමුදලට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තබා ගැනීම කළ හැකි අතර, එකී සංස්ථාපිත නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද, අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

අරමුදලෙහි පාලක මණ්ඩලය

3. (1) අරමුදලේ පරිපාලන, කළමනාකරණය සහ පාලනය මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන පාලක මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතුය.

(2) මෙහි මින්මතු "මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලේ පාලක මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ඌව පළාතේ ආණ්ඩුකාරවරයා
(ආ) ඌව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා
(ඇ) ඌව පළාත් සභාවේ සභාපතිවරයා
(ඈ) ඌව පළාතේ පළාත් සභාවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් .
(ඉ) ඌව පළාතේ ප්‍රධාන ලේකම්වරයා
(ඊ) ඌව පළාතේ ආණ්ඩුකාරවර ලේකම්වරයා
(උ) ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, ආණ්ඩුකාරවරයා විසින් එක් එක් තැනැත්තන් වෙත නිකුත් කරනු ලබන පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තන් විසින් (3) වන සහ (4) වන උප වගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු වුවද, වෙනත් සාමාජිකයින් තිදෙනෙක් යන අයගෙන් සමන්විත විය යුතු අතර ඉන් දෙදෙනෙකු ගණකාධිකාරී හා නීතිඥ වෘත්තියේ නියුතු අය විය යුතුය.

(3) ආණ්ඩුකාරවරයා විසින් (2) වන උප වගන්තියේ (උ)ඡේදය යටතේ පත් කරනු යම් සාමාජිකයෙකුගේ පත්වීම ආණ්ඩුකාරවරයා විසින් තම අභිමතය පරිදි ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (උ) ඡේදයේ යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකුට තමා ඉල්ලා අස්වන බවට වූ ලිපියක් ආණ්ඩුකාරවරයා අමතා යැවීමෙන් ඕනෑම අවස්ථාවකදී මණ්ඩලයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) මණ්ඩලයේ රැස්වීම් හා එම රැස්වීම් වලදී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරගනු ලැබිය හැකිය.

(6) මණ්ඩලයේ සාමාජිකයන්ගේ යම් පුරපාඩුවක් තිබීම හේතු කොටගෙන හෝ එහි යම් සාමාජිකයෙකු පත් කිරීමෙහි යම් දෝෂයක් තිබීම හේතු කොටගෙනම මණ්ඩලයේ යම් ක්‍රියාවක් පෙර කාර්ය පරිපාටියක් අවලංගු වන්නේ යැයි නොසැලකිය යුතුය.

(7) ආණ්ඩුකාරවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතුය.

4. අරමුදල පරිපාලනය කිරීමේදී අරමුදල නමින් පහත දැක්වෙන බලතල මණ්ඩලය සතු ය.

(අ) චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීම, දැරීම හෝ කළමනාකරණය කිරීම.
(ආ) මණ්ඩලයට හිමිකම් ලැබෙන යම් චංචල හෝ නිශ්චල දේපලක් විකිණීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම, නැතහොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.
(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියා හෝ සියළු දේවල් කිරීම.

5. ආධාර මුදල්, පරිත්‍යාග හෝ ත්‍යාග වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර,

5. (1) ඌව පළාතේ ආණ්ඩුකාරවර "අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් මණ්ඩලය විසින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යා යුතු මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු අරමුදලට උපචිතවන සියලු මුදල් ඒ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය. ආණ්ඩුකාර අරමුදලේ ගිණුම

(2) අරමුදලට,

(අ) දීමනා, ප්‍රදාන සහ තැගී වශයෙන් ලැබෙන මුදල්
(ආ) පළාත් සභා අරමුදල් වලින් ගෙවනු ලැබිය හැකි මුදල්
(ඇ) වෙනත් ප්‍රභව වලින් එනම් මෙරට තුල පවත්නා නිත්‍යානුකූලව පිහිටුවා ඇති ආයතනවලින් ලැබිය හැකි මුදල්

6. අරමුදලට අයත් මුදල්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට, අරමුදලේ මුදල් යොදනු ලැබිය හැකි කාර්යය

(1) ඌව පළාත තුල දරිද්‍රතාවයට සහන සැළසීම සඳහා හෝ,
(2) ඌව පළාත් තුල අධ්‍යාපන හෝ ඥානය වර්ධනය කිරීම සඳහා හෝ,
(3) ඌව පළාත් තුල ආගම් නංවාලීම සඳහා හෝ ආගමික වත්පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා හෝ,
(4) ඌව පළාත වෙනුවෙන් විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ප්‍රදානයක් කිරීම සඳහා හෝ,
(5) ආණ්ඩුකාරවරයාගේ හා මණ්ඩලයේ මතය අනුව, ඌව පළාතේ මහජනතාවගේ සුබසිද්ධිය හෝ යහපත පිණිස වූ වෙනත් යම් කාර්යයන් සඳහා හෝ,

(6) ඌව පළාත තුළ ක්‍රීඩා, චිත්‍ර, නැටුම්, සංගීත සංවර්ධනය කිරීම, ආණ්ඩුකාරවරයාගේ විධාන වලට යටත්ව යෙදා ගැනීම, මණ්ඩලයේ වගකීම විය යුතුය.

7. අරමුදලට අයත් යම්, මුදලක් ආණ්ඩුකාරවරයා විසින් දෙනු ලබන යම් යම් විධාන වලට යටත්ව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය. අරමුදලේ මුදල් ආයෝජනය කිරීම.

8. ආණ්ඩුකාරවරයාගේ විධාන වලට යටත්ව මණ්ඩලයට, අරමුදලෙහි නිලධරයෝ සහ සේවකයෝ.

(1) අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයින් පත්කිරීමට,
(2) එසේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය නිශ්චය කිරීමට,
(3) ඒ පාරිශ්‍රමික සහ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීමෙහි ලා දරණ ලද සියලු වියදම් අරමුදලේ ආදායමෙන් ගෙවීමට, බලය තිබිය යුතුය.

9. (1) අරමුදලේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමටත්, වාර්ෂික ගිණුම් පිළියෙල කරවීමටත් මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතුය. විගණන සහ ගිණුම්

(2) විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගිණුම් වර්ෂයක් පාසා විගණන කළ යුතුය. එකී ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වීම සඳහා යම් සුදුසුකම් ලත් විගණකවරයෙකුගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබාගනු ලැබිය හැකි අතර, එවැනි විගණකවරයෙකු විගණකාධිපතිවරයාගේ මෙහෙයුම සහ පාලනය

යටතේ කටයුතු කළ යුතුය. එවැනි විගණනයක ප්‍රතිඵල අඩංගු වාර්තාවක් විගණකාධිපතිවරයා විසින් පළාත් ආණ්ඩුකාරවරයා වෙත සැපයිය යුතු අතර, පළාත් ආණ්ඩුකාරවරයා විසින් ඒ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් දරනු ලැබූ වියදම් පියවීම පිණිස මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික අරමුදලේ ආදායමින් විගණකාධිපතිවරයා වෙත ගෙවනු ලැබිය යුතුය. අරමුදලෙන් විගණකාධිපතිවරයා වෙත ලැබුණු යම් පාරිශ්‍රමිකයකින් එකී විගණනය සඳහා ඔහු විසින් සේවයේ යොදවනු ලැබූ සුදුසුකම් ලත් යම් විගණකවරයෙකුට හෝ විගණකවරුන්ට ඔහු විසින්ම ගෙවනු ලැබූ මුදල් අඩු කිරීමෙන් පසු ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයකු" යන යෙදුමෙන්,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයෙකු වන්නා වූ ද, ගණකාධිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තන් හෝ,

(ආ) එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටවනු ලැබූ වෙනත් ආයතනයක සාමාජිකයෙක් වන්නා වූ ද, ගණකාධිකාරීවරයෙකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නාවූ ද, නේවාසික හවුල් කරුවන්ගෙන් සමන්විත වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් අදහස් වේ.

රීති සෑදීමට මණ්ඩලයට ඇති බලය.

10. මණ්ඩලයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය පාවිච්චි කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කෙරෙහි බලපාන හෝ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කවර වුවද, කාරණයක් සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන රීති, ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට, යටත්ව මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපනය

11. මෙම ප්‍රඥප්තියෙහි "රාජ්‍ය බැංකුව" යන පදයෙන් ලංකා බැංකුව, මහජන බැංකුව, ඌව සංවර්ධන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් කෙරේ.

05–407

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.